හඳුනාගනිමු අපගේ සතුරන් - මිතුරන්

මේ අවසන් වූ ත්‍රස්ත විරෝධී යුද්ධය අප කාටත් අප දේශයේ සතුරන් සහ මිතුරන් වෙන්කර හඳුනා ගැන්මට මහඟු අවස්ථාවක් විය. ජාතික ප්‍රශ්නය ගැන පැහැදිලි අවබෝධයක් නොතිබුණු අයට ද මෑතකදී සටන් තීව්‍රවීමත් සමගම වැඩියෙන් අවධානය යොමුවීම නිසාම මෙවන් අවබෝධයක් නිතැතින්ම ලැබිණ. ඒ සතුරන් සහ මිතුරන් ගැන විමසුමක් කිරීම මෙම ලිපියේ අරමුණ වෙයි. රටේ ඉදිරි කටයුතු වලදී පැටලිලි රහිතව මේවා තෝරා බේරාගෙන වැඩකිරීම කාටත් වැදගත් වන බැවිනි.

දේශයේ සතුරෝ

සතුරන් ගැන විමසුමකින් මෙය අරඹමු. සතුරන් පැහැදිලිව හඳුනාගත් විට මිතුරන් හඳුනා කටයුතු කිරීම පහසු වෙයි. ප්‍රධාන වශයෙන් මොවුන් කොටස් දෙකකි. ඒ අභ්‍යන්තර සතුරන් සහ බාහිර සතුරන් යනුවෙනි.

අභ්‍යන්තර සතුරෝ

කාලයක් තිස්සේ වර්ධනය වූ කොටි සංවිධානය රට තුළ ප්‍රධානම සතුරා විය. මොවුන් අන්ත ත්‍රස්තවාදී පිරිසක් මිස කවර විටෙකවත් දේශපාලන සංවිධානයක් නොවීය.

ද්‍රවිඩ දේශපාලන ක්ෂෙත්‍රය තුළ කොටි සංවිධානයට එදිරිව මුල සිටම දිගටම අදහස් දැක්වූ ඩග්ලස් දේවානන්ද මහතාගේ **EPDP** සංවිධානය වැනි ඒවා රජයේ ක්‍රියාකාරී සහායක පිරිසක් වශයෙන් කටයුතු කළහ. එපමණට ඉදිරියෙන් නොසිටියද තවත් ද්‍රවිඩ සංවිධාන ගණනාවක් වූහ. සමහර සංවිධාන මධ්‍යස්ථව සිටි අතර ඒ ඒ අවස්ථාවල මතුවූ තත්වයන් අනුව විටෙක කොටින් සමගද විටෙක රටේ බහුතරය සමගද කටයුතු කළහ. **TULF** පක්ෂයේ ආනන්ද සංගරී මහතා එයට හොඳම නිදසුනයි. බොහෝ විට අවස්ථාවාදී තත්වයෙන් කටයුතු කළ ඔහු දැන් අතරමං වී ඇති බවක් පෙනේ. කොටි සංවිධානයේ බලය බිඳ දමා ඇති නව පරිසරය තුළ මේ බොහෝ දේශපාලන කණ්ඩායම් සිය ස්ථාවරය තවම පැහැදිලි කර ගෙන නැතිවා වියහැක. මේවා ගැන විමසිලිමත්ව කටයුතුකිරීම වැදගත්ය.

නමුත් කොටින්ගේ අතකොළුවක් ලෙස පාර්ලිමේන්තුවට රිංගාගත් **TNA** සංවිධානයේ මන්ත්‍රීවරුන් ගැන විශේෂයෙන් විමසිලිමත් විය යුතුය. කොටි විරෝධී සටන් උග්‍රවූ අවස්ථාවලදී පවා මන්ත්‍රී විශේෂ වරප්‍රසාද ලබමින්ම දේශද්‍රෝහි ලෙස විවෘතවම කටයුතු කරමින් ලොව සැරිසැරූ මුත් දැනුදු එසේ කටයුතු කරන්නේදැයි සෙවිය යුතුය. ඉදිරියේ ද්‍රවිඩ ජනයා අතර පැවැත්වෙන ඡන්දයක දී මොවුන් අතු ගැවීයන පරිදි මුන්ගැන ඒ පළාත් වල ජනතාවට අවබෝධකරදීම වැදගත් ය.

විවිධ දේශපාලන පක්ෂ-වල සමහර කණ්ඩායම්

පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සමහර කණ්ඩායම් විවිධ අවස්ථාවල දේශයේ සතුරන් වශයෙන්ද අඩු හෝ වැඩි ප්‍රමාණයෙන් කටයුතු කර ඇත. යූ ඇන් පී යේ ලොකු කොටසක් එයින් කැඩී රජය සමග එකතුවී පසුගිය කාලයේදී දේශප්‍රේමී සටන්වල සෑහෙන මෙහෙවරක් ඉටුකර ඇත. නමුත් රනිල් වික්‍රමසිංහ මහතා සමග ඉතුරු වූ කොටස කොටින්ට සහාය දෙමින් දේශද්‍රෝහී ලෙස පසුගිය කාලයේ කටයුතු කළ ආකාරය කවුරුත් හොඳින් දනිති. සුළු උදාහරණයක් වශයෙන් රටේ හමුදාපති සැල්වේෂන් ආම්එකට (ගැලවීමේ හමුදාවට) වත් සුදුසු නැතැයි මැතදෙඩු මුන්ගෙන් එකෙක් දැන් කියන්නේ කුමක්දැයි ඇසිය යුතු ය. යුද්ධය අවසන් වූ පසු ද බටහිර රටවල් අපට එරෙහිව අවි අමෝරමින් එනවිට එම රටවල පසුගිය දිනවල උන්ගේ සපත්තු ලෙවකමින් සැරිසැරූ රනිල් දේශය සඳහා මොන මෙහෙවරක් ඉටු කරන්නට ඒ ගමන ගියේදැයි යන්න අදත් පිළිතුරක් නැති ප්‍රශ්නයකි. මුන් සමග සිටින රාවුප් හකීම්ගේ නායකත්වයෙන් යුත් මුස්ලිම් කොන්ග්‍රසයේ සුළු පිරිසද මෙයට නොදෙවෙනි ය.

මෙසේම දේශපාලන කුණු බක්කියට වැටී සිටින වික්‍රමබාහුලා වැනි වාමාංශික අතරමං වූවන්ද පසුගිය කාලයේ ගෙනගිය දේශද්‍රෝහී ක්‍රියාකලාපය කවුරුත් දැක්කාහ. තවත් මෙවැනි වාමාංශිකයෝ වූහ. මේ සියළු දෙන දැන්වත් කළ වරද පිළිගෙන සිය දේශය වෙනුවෙන් ඉදිරි මෙහෙවර කිරීමට ඉදිරිපත් වූවහොත් ජනතාව අතර යම් පිළිගැන්මක් ලද හැකිය. එසේ නොකළ හොත් මේ සඳහන් කළ උන් සියල්ලම ඉතිහාසයේ කුණු බක්කියට සඳහටම විසිවෙනවා ඇත.

අප අතරම ඇති කොටි සහායකයෝ

අප අතරම කටයුතු කරන සමහර අයද දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ පසුගිය සමයේ දේශද්‍රෝහී ලෙසද කටයුතු කළ අවස්ථා තිබිණ. ඔවුන් නම් අප මාධ්‍ය තුළ එනම් පුවත් පත් ටෙලිවිෂන් සහ රේඩියෝ යන අංශවල නිරතව සිටින සමහරුන්ය. ජනමතය නැසිරවීමේ ප්‍රබල අවියක් වූ මාධ්‍යයේ කටයුතු කරන්නන් ඩැහැගැනීමට කොටි සතුරා දිගටම වෙහෙසුණු අතර සමහරු යම් යම් වරප්‍රසාද ආදියට කෑදරව ඒවාට යටවූ අවස්ථා බොහොමයකි. මාධ්‍ය කටයුතු ගැන රජය හා ජනතාව වඩා විමසිලිමත් වීමත් දේශ ප්‍රේමී මාධ්‍යය ප්‍රබලවීමත් සමග මෑතක මේවා මගහැරී ගියේය. මෙසේම අප අතර සිටි සමහරු ආත්මාර්ථ කාමීව වාසි සඳහා කොටින්ට සහාය දුන්නෝ වූහ. සිංහළ කොටි හමුදා කොටි යනුවෙන් හඳුන්වනු ලැබූ මුන් අතිශය නීච දේශද්‍රෝහී පිරිස් ම වූහ. තමා ජනිත කළ මව වුවද විකිණීමට සූදානම් මොවුන් අධමයින් ලෙස හෙළාදැකිය යුතුය. ජනතාව වඩා විමසිල්මත්වීම සමග මොවුන් අල්ලා දඬුවම් කිරීමටත් මැඩලීමටත් හැකිවිය. කොටින්ට පක්ෂපාතීව සිටි යම් යම් මාධ්‍යවේදීන් ගැන දැනුදු තොරතුරු අසන්නට ලැබේ. මේ නොබෝදා මේ පිළිබඳව ශ්‍රීලංකා පොලිස් පතිවරයාද ප්‍රකාශයක් කර තිබුණි.

රාජ්‍ය නොවන සංවිධාන

Non-Governmental Organization (NGO) හෙවත් රාජ්‍ය නොවන සංවිධාන හෙවත් එන්පීඕ කාරයින් යනුවෙන් දැන් නිතර කතාබහට ලක්වන මේවා දෙකොටසකට බෙදිය හැකිය. අභ්‍යන්තර දේශීය සහ බාහිර විදේශීය වශයෙනි. මේ දෙඅංශයේම රටට සේවාවක් අවංකවම කළ අය සිටියද සමහර සතුරෝ ද වූහ. බාහිර සතුරන් වූ **International NGO** හෙවත් **INGO** කාරයින් කොටින්ට ආයුධ දෙමින් රේඩියෝ සැටලයිට් ආදී සන්නිවේදන උපකරණ සපයමින් අප රටට කළ ද්‍රෝහී ක්‍රියා පසුගිය කාලයේ අප රට කවුරුත් හොඳින් දනිති. කොටින්ගෙනුත් සමහර **INGO** කාරයින්ට මුදල්මය උදව් ලැබුණේදැයි සැක සිතෙන අවස්ථාද විය. කුමාර් රූපසිංහලා වැනි අය රජයට එරෙහිව දේශද්‍රෝහී ප්‍රකාශන කළ අවස්ථාවල දී ඒ සැකය මතුවී ආවේ ය.

අභ්‍යන්තර සතුරන් ගැන විමසිලිමත්ව සිටීම

තීරණාත්මක සටනක් ජයග්‍රාහී ලෙස අවසන්වී ජනතාව සහ රජය සෝදිසිමත්ව සිටින මේ අවස්ථාවේ මේ ඉහත දැක්වූ අභ්‍යන්තර සතුරන් නිහඬව සැඟවී සිටියද නැවත අවස්ථාව බලා එළියට එනු නොඅනුමානය. එබැවින් මෙකී නොකී අයගේ කටයුතු ගැන විමසිලිමත්ව කවුරුත් සිටීම ඉතා වැදගත් වනු ඇත. අවධානය ඉවත නොගත යුතුය.

බාහිර සතුරෝ - බටහිර රටවල දෙමළ ඩයස්පෝරාව

1983 කලබල වලට පසු ඇමරිකාව, කැනඩාව, බ්‍රිතාන්‍යය ප්‍රමුඛ ප්‍රංශය, ජර්මණිය වැනි **EU** රටවලට රිංගාගත් කවදත් සිංහළයාට සහ ශ්‍රීලංකා රජයට ද්‍රෝහී වූ දෙමළ ඩයස්පෝරාව සහ උන්ගෙන් පැවතෙන ඊළඟ පරම්පරාව අප දේශයේ ප්‍රධානම හතුරෙකි. සමහරුන් මධ්‍යස්ථව සිටියද මෑතකදී සටන් උග්‍රවත්ම මොවුන්ගේ **95%** ක්ම නියම ස්වරූපය පෙන්වමින් අවි අමෝරාගෙන කටයුතු කරති. සෑම ජඩකමක්ම කරමින් කොටි ව්‍යාපාරයට ආර්ථික හා ද්‍රව්‍යමය පදනම සැපයූ මොවුන් අනාගතයේදීද විශාල සතුරු උවදුරක් වනු ඇත. මොවුන් ගැන ඉදිරි කලාපයේ විශේෂ විමසුමක් කෙරෙන බැවින් මෙතැනදී මෙයට වඩා විස්තර නොකරමු.

බටහිර මාධ්‍ය තුළ සිටින සතුරෝ

මුල සිටම අද දක්වාමත් අපට සතුරුකම් කළ සහ කරන **BBC** ප්‍රධාන බ්‍රිතාන්‍යයේ **TV** මාධ්‍යයත්, මුල දී මධ්‍යස්ථව සිටියද පසුව කොටි වෙනුවෙන් ප්‍රචාර පටන්ගත් ඇමරිකානු **CNN**, බ්‍රිතාන්‍යයේ **Channel 4** සහ **AlJazeera** වැනි ටෙලිවිෂන් මාධ්‍යයනුත් මේ ගණයට අයත් වේ. දැන් තරමක් සැර බාලකර ඇති නමුත් මුන් ගැන බටහිර රටවල සිටින දේශප්‍රේමීහු හඳුනාගත්හ. මේ **TV** මාධ්‍ය සමගම එකම ජාලයක්සේ කටයුතු කළ සම හර බටහිර පුවත්පත්ද අවි අමෝරා දත් විලිස්සමින් අපවැනි රටකට එළි පිටම නැටූ නැටිල්ල මෙපමණ කලක් යුක්තිගරුක යයි සම්මතව පැවති බටහිර මාධ්‍යයට ම විළිලැජ්ජාවකි. විශේෂයෙන් බ්‍රිතාන්‍යයේ ගාඩියන් සහ ටෙලිග්‍රාෆ් වැනි පුවත්පත් මෙතැනදී සඳහන් කළ යුතු ය.

බටහිර රටවල් සහ ඒවායේ සමහර දේශපාලන පක්ෂ

බැංකු අර්බුදයෙන් ආරම්භවී එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය සහ **EU** රටවල් අද තදබල ආර්ථික අර්බුදයක එරී සිටිති. පිබිදී එන චීනය, ඉන්දියාව ප්‍රමුඛ පෙරදිග බලවතුන්ටද, රුසියාව වැනි රටවලටද මේ අර්බුදය තදින් බලපා නැති අතර ලෝක ආර්ථික බල තුලනය ඒ පැත්තට හැරවී ඇත. ලෝකයේ ඉදිරි බලය පිළිබඳ බලතුලන යද බටහිරින් ගිලිහී පෙරදිගට හැරෙන ලකුණු පෙනීයන දැන්මේ ගරා වැටුණු පරණ බලවතුන් දැන් දැන් තැතිගැන්වී ඇත. අපේ පරණ අධිරාජ්‍ය පාලකයන් වූ බ්‍රිතාන්‍යය සිතුවේ ලංකාවට බල පෑම් කර කොටි ත්‍රස්තයින්ට සහන සැලසීමටය. එම ගෙරවිල්ල අප රට තුට්ටුවකටවත් ගණන් නොගෙන කටයුතු කිරීම උන්ට රිස්සුවේ නැත. විශේෂයෙන්ම මෙහි කොටි ඩයස් පෝරාවේ ඝෝෂාවට යටවූ බ්‍රිතාන්‍යය ලේබර් පක්ෂයත්, ලිබරල්කාරයනුත් අපට කෙලින්ම සතුරුවූහ. එක්සත් ජනපදයේ කොටි උදව් ලද හිලරි ක්ලින්ටන්ද උන්ට පක්ෂව නැටුවත් ඒවා ව්‍යවර්ථ වී ඇති බවක් දැන් පෙනේ. පසුගිය කාලයේ හැසිරුණ හැටියෙන් මුන් අපේ සතුරන් බව පැහැදිලිව හඳුනාගනිමු.

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලය

United Nation Human Rights Council (UNHRC) කොටින්ගේ පව තොරතුරු මත සහ ටැමිල් නෙට් වැනි වෙබ් අඩවිවල පළ කළ බොරු අහුලාගත් බටහිර මේ මාධ්‍ය පුවත් යුද්ධයෙන් කොටින්ගේ පරාජය ඉවසාගත නොහැකිව යුද්ධයේදී අපරට මානව හිමිකම් උල්ලංඝණය කළේය යන අභූත චෝදනාව ඉදිරිපත් කළහ. එක්සත් ජනපදය බ්‍රිතාන්‍යය ප්‍රමුඛ **EU** රටවල් මෙය අර එක්සත් ජාතීන්ගේ **UNHRC** විශේෂ සැසියකට ගෙන ඒමට කටයුතු කළහ. දැනට එහි සිටින සාමාජිකයන් 47 දෙනාගෙන් 17 කට විවිධ බලපෑම් කොට අත්සන් ගෙන මෙය යොදාගත් නමුදු එම යෝජනාව අහිබවා යන ප්‍රතිවිරුද්ධ යෝජනාවක් ලංකාව ඉදිරි පත් කළාය.

පසුගිය කාලයේ ඉරාකය ඇෆ්ඝනිස්ථානය සහ ඊයේ පෙරේදා පකිස්ථානය වැනි රට වල සියදහස් ගණනින් බෝම්බ දමමින් මිනීමැරූ මේ බටහිරයන් අපට අභූත චෝදනා නැඟීම හාස්‍යජනක විය.

මේ ගැන විවාදයේදී අප වටා සිටින සමස්ථ ආසියානු රටවල්ද, මුන් ගැන මනාව දන්නා අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල්ද ත්‍රස්තවාදය විනාශ කරලීම ගැන අප රටට ප්‍රශංසා මුඛයෙන් කථාකළ අතර බටහිර රටවල් ගෙනා යෝජනාව කුණු බක්කියට වැටෙමින් අපේ යෝජනාවට පක්ෂව ඡන්ද 29 ක්ද බටහිර රටවලට පක්ෂව ඡන්ද 12 ක්ද සහ රටවල් 6ක් ඡන්දය දීමෙන් වැලකී සිටීමෙන් අපට විශ්ෂඨ ජයක් ලැබිණ. බටහිරයනට මුලදී පක්ෂව සිටි රටවල් 5 ක්ද අවසානයේ ශ්‍රීලංකාවට පක්ෂව ඡන්දය දීමද විශේෂ සිද්ධියක් විය.

අපේ නියම මිතුරෝ

රටේ අභ්‍යන්තරයේ ජනතාවගෙන් 95% ක්ම දේශයේ මිතුරන් මෙන් පසුගිය කාලය තුළ එකාමෙන් පෙළගැසීම අප රටේ ඉදිරි අනාගතය පිළිබඳ ශුභ නිමිත්තකි.

බාහිර සතුරෝ

පසුගිය සමයේ උග්‍ර යුද්ධයකට ද්‍රව්‍යමය ලෙසම ආධාර කළ අසල්වැසි චීනය සහ පකිස්ථානය විශේෂ තැනක් ගනී. බටහිර සතුරන් අපට වළකැපීමට තැත්කළ හැමවිටකම එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ නිශේධ බලය ඇති ලොව ප්‍රබලම රටවල් දෙකක් වන රුසියාව සහ චීනයට අප දේශයේ ඉමහත් කෘතඥතාව පළකළ යුතුමය. ඒ නොවන්නට සතුරන් අද අපව සම්බල්කර හමාරය.

එසේම ලෝකයේ පිබිදීගෙන එන රටවල් වන ඇත කියුබාව, වෙනිසියුලාව, බ්‍රසීලය ප්‍රමුඛ ලතින් ඇමරිකානු රටවල්ද, නයිජීරියාව, දකුණු අප්‍රිකාව, ඊජිප්තුව ප්‍රමුඛ අප්‍රිකානු රටවල් ද, ඉන්දුනීසියාව, මැලේසියාව හා ඉන්දියාව ප්‍රමුඛ අපට සමීප ආසියානු රටවල් නියම මිතුරන් බව පෙන්වා ඇත. මේ සැමටම කෘතඥතාව පළකරන අතරම මේ සැමගේ ආශීර්වාදයෙන් අප ඉදිරි අනාගතය දීප්තිමත් වනු නොඅනුමාන ය.

♦ **වකුල ගුණාපාල**
Ilford- Essex -UK

(ලේඛකයා කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණික අංශයේ ප්‍රධානියා වශයෙන් සේවය කළේය. නයිජීරියාවේ ද මහා බ්‍රිතාන්‍යයේද ගුරුවරයෙකු වශයෙන් කටයුතුකර ඇත.)

මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ නායක රවුප් හකීම් කොටි සංවිධානය සමග ගිවිසුමකට **2002** අප්‍රියෙල් මස කිලිනොච්චියේ කොටි නිල නිවසේදී අත්සන් තැබූ අවස්ථාවේ හකීම්, ප්‍රභාකරන්ට අතට අත දෙන අයුරුය මේ. තමිල් වෙල්වම් ද ඇවිලේ බාලසිංහම්ද වම් පසින් වෙති. **2006** අගෝස්තු **3** වෙනි දින කොටි යළිත් මුස්ලිම් වැසියන් ඝාතනය කළෝය.

නෝර්වේ සාම නියෝජිත එරික් සොල්හයිම් නිතර නිතර කිලිනොච්චියට ගිය කෙනෙකි. ඔහු 2002 සිට කොටි සහ ශ්‍රීලංකා රජය අතර සාම ගිවිසුමක් ඇති කරන්නට විශාල වෙහෙසක් දැරුවේය. ඔහු කොටින්ට සිටි වඩාත්ම විශ්වාසිත මිතුරා වූ අතර වන්නිය ඔහුට හුරු පුරුදු තැනක් වුණි. අවසාන මොහොතේ ප්‍රභාකරන් අතුළු කොටි රැළ මුදාගෙන යාමට ඔහු ඇතුළු නෝර්වේ රට නොගත් මහන්සියක් නැත. ප්‍රභාකරන් ද එය බලාපොරොත්තුව සිටියේය. අවසානයේ ඒ කිසිවකින් වැඩක් වුණේ නැත. ප්‍රභාකරන් අපායට ගියේය. සොල්හයිම් කොපමණ හිතේ අමාරුවෙන් ඇත්දැයි අපට අද සිතාගත හැකිය.